# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## 6

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය

## ව්‍යාපාර ආරම්භයට ප්‍රවේශයක්

**(1)**

01. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් රථයක් වෙළෙඳපොළට හඳුන්වාදීම සැලකිය හැක්කේ

(1) පවත්නා භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය.
(2) පවත්නා භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය.
(3) නව භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය.
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය.

02. තම භාණ්ඩය හෝ සේවාව මිලදී ගනු ඇතැයි අපේක්ෂා කරන හෝ අනාගතයේදී මිලදී ගැනීමට පොළඹවා ගැනීමට හැකි වේයැයි අපේක්ෂා කරන පුද්ගලයන් ලෙස සැලකිය හැක්කේ,

(1) පාරිභෝගිකයාය
(2) ගනුදෙනුකරුවන්ය
(3) ඉලක්කගත පාරිභෝගිකයාය
(4) අලෙවිකරුවන්ය

03. SCAMPER ආකෘතිය අනුව රූපවාහිනියට අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට සැලැස්වීම,

(1) ආදේශ කිරීම
(2) සම්බන්ධ කිරීම
(3) එකතු කිරීම
(4) වෙනත් කාර්යයන් සඳහා භාවිතා කිරීම

04. කාන්තාවන්ගේ රුව වඩවන විටමින් අඩංගු බෙහෙත් පෙත්තක් වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. මෙහි ඉලක්ක පාරිභෝගිකයන් විය හැක්කේ,

(1) අවු 20-50 අතර කාන්තාවන්
(2) අවු 20 ට අඩු කාන්තාවන්
(3) අවු 50 ට වැඩි කාන්තාවන්
(4) රටේ සියළුම කාන්තාවන්

05. අන්තර්ජාල පාඨමාලා පැවැත්වීමට සුදුසු ස්ථානයක් වන්නේ

(1) පාසල් වලට නුදුරු ස්ථානයක්
(2) තමා පදිංචි නිවසයි
(3) නිසංසල ස්ථානයක්
(4) ජනාකීර්ණ ස්ථානයක්

06. ෂැම්පු ෂැෂේ පැකැට්ටුව, බඩි බීම බෝතලය SCAMPER ආකෘතිය තුල ඇතුළත් වන්නේ,

(1) විශාල කිරීම
(2) ඉවත් කිරීම
(3) කුඩා කිරීම
(4) ආදේශ කිරීම

07. පහත භාණ්ඩ හා සේවා සඳහා පිළිවෙලින් ගැලපෙන ඉලක්ක සඳහා පාරිභෝගිකයන් නිවැරදිව දක්වන ලද පිළිතුර තෝරන්න.

| භාණ්ඩ/සේවා | ඉලක්කගත පාරිභෝගිකයා |
|---|---|
| 1. අභ්‍යාස පොත් | A. කාන්තාවන් |
| 2. රන් භාණ්ඩ | B. 4,5 ශ්‍රේණි වල සිසුන් |
| 3. ක්‍රීඩා භාණ්ඩ | C. පාසල් සිසුන් |
| 4. ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර | D. සංගීත විෂය හදාරණ සිසුන් |
| 5. සංගීත භාණ්ඩ | E. ක්‍රීඩකයන් |

(1) C,A.E,B.D
(2) B,A,E,C,D
(3) A,B,C,D,E
(4) C,A,E,D,B

08. උත්සව ශාලාවක් පවත්වාගෙන යාමට වඩාත් උචිත ස්ථානයක් වන්නේ

(1) මාර්ග පහසුකම් සහිත නිසල පරිසරයක ඇති ආකර්ශනීය ස්ථානයක්
(2) වාහන නවතා තැබිය හැකි මාර්ග පහසුකම් සහිත ස්ථානයක්
(3) විශාල ඉඩක් සහිත ජනාකීර්ණ ස්ථානයක්
(4) ගංගා දිය ඇළි සහිත කඳු ප්‍රදේශයකි

09. අභ්‍යවකාශයට සංචාරක සේවාවක් ආරම්භ කිරීම සැළකිය හැක්කේ

(1) පවත්නා භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(2) පවත්නා භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(3) නව භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය

10. දැව වෙනුවට ප්ලාස්ටික් භාවිතය තුලින් නිෂ්පාදන බිහි කිරීම

(1) නවෝත්පාදනයකි
(2) සුවිශේෂී නිෂ්පාදනයකි
(3) නිෂ්පාදන ප්‍රභේදනයකි
(4) වෙළදපොළ හිඩැස හඳුනා ගැනීමකි

11. දියවැඩියා රෝගීන් සඳහා විශේෂිත පාවහන් හඳුන්වාදීම සැලකිය හැක්කේ

(1) පවත්නා භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(2) පවත්නා භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(3) නව භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙසය

12. ආර්ථික පිරිමැසුම් සහිත කිරිපිටි පැකට්ටුවක් (budget pack) ඉදිරිපත් කරමින් වෙළෙඳපොළට පිවිසීම හැඳින්විය හැක්කේ,

(1) නිෂ්පාදන ප්‍රභේදනය ලෙසය
(2) වෙළදපොළ හිඩැස පිරවීම ලෙසය
(3) නවෝත්පාදනය ලෙසය
(4) සුවිශේෂී නව භාණ්ඩයක් ලෙසය

13. SCAMPER ආකෘතියට අනුව සම්බන්ධ කිරීමට (ප්‍රතිලාභ කිහිපයක් එකතු කිරීම) අයත් උදාහරණයක් වන්නේ,

(1) දුරකථනයට කැමරාව
(2) කුඩා පරිගණකය
(3) මේද රහිත කිරි
(4) මෙගා බීම බෝතලය

14. පාරිභෝගිකයා විසින්ම තම භාණ්ඩය තෝරා ගැනීමේ ක්‍රමය වර්තමානයේදී බෙහෙවින් ප්‍රචලිත අලෙවි ක්‍රමයකි. මෙම ක්‍රමය හැඳින්විය හැක්කේ,

(1) නව සොයා ගැනීමක් ලෙසය
(2) දිගුවක් ලෙසය
(3) අනුකරණය කිරීමක් ලෙසය
(4) සංකලනයක් ලෙසය

15. පහත "අ" හි සඳහන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගතයුතු වැදගත් තීරණ "ආ" හි සඳහන් නිදසුන සමග පිළිවෙලින් නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. ව්‍යාපාරය සඳහා කොතරම් කැපවිය යුතුද? | A. කාන්තාවන් |
| 2. ඉලක්ක පාරිභෝගිකයා කවුද? | B. ප්‍රමාණවත් ලාභයක් ලබාදීම |
| 3. ඉපයීම් ප්‍රමාණවත්ද? | C. සේවකයන් සොයා ගැනීම හා මෙහෙය වීම |
| 4. ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද? | D. බැංකු ණය හා කල් බදු ලබා ගැනීම |

(1) C,A,B,D
(2) A,B,C,D
(3) C,D,A,B
(4) D,B,A,C

**(2)** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ගතයුතු තීරණ 4ක් නම් කරන්න.
02. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී ව්‍යවසායකයෙකු විසින් ඉටු කළ යුතු කාර්යයන් 04 ක් නම් කරන්න.
03. ඉලක්ක පාරිභෝගිකයා කවුද?
04. නව ව්‍යවසායකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ග 04 ක් දක්වන්න.
05. ව්‍යාපාරයක ආරම්භක ස්ථානය තේරීමේදී සැළකිය යුතු කරුණු 04 ක් නම් කරන්න.
06. නව ව්‍යවසායකයෙකුට වෙළෙඳපොළට පිවිසිය හැකි ක්‍රම මොනවාද?
07. ව්‍යවසායකයෙකුට නිෂ්පාදන නව්‍යකරණය කළ හැකි ක්‍රම 4 ක් SCAMPER ආකෘතිය ඇසුරින් නම් කරන්න.
08. නව ව්‍යාපාරයක් සඳහා සාර්ථක පිවිසුම් උපාය මාර්ග 04 ක් නම් කරන්න.
09. නිෂ්පාදන ප්‍රභේදනය යනු කුමක්ද?
10. වෙළඳපොළ හිඩැස යනු කුමක්ද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව